# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,818 - 2013 ජූලි මස 05 වැනි සිකුරාදා - 2013.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1030 | රජයේ නොවන දැන්වීම් ... ... ... | 1033 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1040 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1031 | විවිධ දැන්වීම් ... ... ... | — |



*සැ. යු.-* (i) ගල්හින්න ජාමිඅතුල් ෆක්තාහ් අරාබි විදුහල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී ;

(ii) ගබඩා ව්‍යාපෘති (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී ;

(iii) සෙරෙට්සෙ බාමා පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූලි මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූලි මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - ත්‍රිකුණාමලය**

රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ ටෙන්ඩර් මගින් විකිණීම

කන්තලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය සහ මුතුර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත සඳහන් රථ වාහන ටෙන්ඩර් කැඳවා විකිණීමට ත්‍රිකුණාමලය මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත.

විකිණීමට අදාළ රථ වාහන පහත සඳහන් අධිකරණයේ දී 2013.07.10 වැනි දිනට පසුව අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා මගින් පරීක්ෂා කිරීමට හැකි ය. මීට අදාළ ටෙන්ඩර් ලියකියවිලි ත්‍රිකුණාමලය මහාධිකරණ ගණකාධිකාරිවරයාගෙන් 2013.07.15 වැනි දින සිට ලබා ගත හැකි ය. 2013.07.30 වැනි දිනෙන් ටෙන්ඩර් කැඳවීම අවසන් කරනු ලබන අතර, 2013.08.05 වැනි දින පෙ. ව. 12.00 ට විවෘත කරනු ලැබේ. මේ සඳහා ආපසු නොගෙවන ද රු. 100 ක ගාස්තුව ගෙවිය යුතු ය.

කාර්යාලයෙන් ලබාගනු ලබන අයදුම්පත්‍රය හැර අනෙකුත් අයදුම්පත්‍ර හා ඡායා පිටපත් පිළිනොගෙන ප්‍රතික්ෂේප කරනු ලැබේ. එක් ටෙන්ඩර් ඉල්ලුම්කරුවෙකුට එක් රථ වාහනයකට වඩා වැඩි රථ වාහන සංඛ්‍යාවක් සඳහා ඉල්ලුම් කළ හැකි අතර, එසේ වුව ද සියලු ම රථ වාහන සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. අනෙකුත් විස්තර හා කොන්දේසි ටෙන්ඩර් ලියකියවිලි සමග සපයනු ලැබේ.

මීට අමතරව රථ වාහන පිළිබඳ විස්තර හා ආපසු ගෙවන තැන්පත් මුදල් පිළිබඳ විස්තරය පහත සඳහන් වේ.

| *අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තර* | *පරීක්ෂා කළ හැකි ස්ථානය* | *ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| 01. | MC 35902 | අශෝක් ලේලන්ඩ් වර්ග ඩිපර් CPLF 3870 | මහෙස්ත්‍රාත් අධිකරණය, කන්තලේ | 10,000 0 |
| 02. | MC 36953 | මිට්ෂුබිෂි වර්ග සුදු පැහැති ලොරිය EPLF 2866 | මහෙස්ත්‍රාත් අධිකරණය, කන්තලේ | 7,500 0 |
| 03. | MC 37030 | ටාටා ඩිමෝ වර්ග බට්ටා ලොරි EPPP 2438 | මහෙස්ත්‍රාත් අධිකරණය, කන්තලේ | 7,500 0 |
| 04. | MC 3935/04 | මැසිෆගියුෂන් වර්ගයේ ට්‍රැක්ටර් රථය (ඩීසල්) 49-4643 | මහෙස්ත්‍රාත් අධිකරණය, කන්තලේ | 5,000 0 |
| 05. | MC 3935/04 | අළු පැහැති ට්‍රැක්ටර් ටේලරය 46-7508 | මහෙස්ත්‍රාත් අධිකරණය, කන්තලේ | 1,000 0 |
| 06. | නඩු අංක නැත | ඉසුසු වර්ග ලොරිය 27 ශ්‍රී 4131 | මහෙස්ත්‍රාත් අධිකරණය, කන්තලේ | 1,000 0 |
| 07. | MC 14121/09 | ත්‍රිරෝද රථය EPJL-8493 | මහෙස්ත්‍රාත් අධිකරණය, මුතුර් | 1,000 0 |

ඒ. ප්‍රේමශංකර්,
මහාධිකරණ විනිසුරු,
සභාපති,
මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව.

2013 ජූනි මස 14 වැනි දින,
මහාධිකරණය,
ත්‍රිකුණාමලය.

07-02

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### රා තැබෑරුම් රේන්ද විකිණීම - 2014 වර්ෂය

2014 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව, 2013.08.07 වැනි දින පෙරවරු 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියමකර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් ඉහළ කෙළවරෙහි තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමෙහි ''අංකය හා නම'' ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත් භාර ගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2013.08.07 වැනි දින පෙරවරු 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බදුල්ල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2013.10.23 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින පස්වරු 2.00ට පෙර බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

08. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේ දී දැන ගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිවේ.

ගාමිණී මහින්දපාල ජෝපියස්,
ප්‍රාදේශීය ලේකම්,
බදුල්ල.

2011 ජුනි මස 14 වැනි දින,
බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

2014 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තු "බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය" 2014.01.01 වැනි දින සිට 2014.12.31 වැනි දින දක්වා

**උපලේඛනය**

| | *තැබෑරුමේ නම සහ ලිපිනය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රා. ලේ. කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | බදුල්ල අංක 01 රා තැබෑරුම | බදුල්ල | බදුල්ල මහ නගර සභා අංක 06 දරන කොට්ඨාසයේ හුණුකොටුව නමැති රජයේ ඉඩම | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 5,000 | 2013.08.07 පෙ.ව. 10.30 |

*නැවත විකුණන දිනය* .- සාර්ථක ගැණුම්කරුවෙකු ඉදිරිපත් නොවුවහොත් 2013.10.23 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකිණීම සිදු කෙරේ.

07-26

## නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - අනුරාධපුරය

### රා තැබෑරුම් රේන්ද විකිණීම - 2014 වර්ෂය

2014 වර්ෂයට පහත දැක්වෙන තැබෑරුමේ පැසුණු රා විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර පහත සඳහන් කොන්දේසිවලට යටත්ව භාරගනු ලැබේ :-

(i) 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි, සහ

(ii) සියලු සුරාබදු නීතිය යටතේ දැනට බලපවත්වන සාමාන්‍ය කොන්දේසි.

02. මෙම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයක ලියන ලද සෑම ටෙන්ඩර් පතක්ම රු. 2,000 ක මුදලක් ගෙවා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් සමඟ ඉදිරිපත් කළ යුතු ය.

03. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය සමඟ ඔවුන්ට අයත් නිශ්චල දේපළවල වටිනාකම් සහතිකයක් ප්‍රාදේශීය මහ ලේකම් තැනගෙන් ලබාගෙන ඇමිණිය යුතු ය. එය තැබෑරුමට ඉල්ලුම් කරන ටෙන්ඩර් මුදලේ වටිනාකමින් සියයට පහළොවක් (15%) නොඅඩු සහතිකයක් විය යුතු ය. මෙම ඡේදයේ සඳහන් වන සහතිකයට අදාළ නිශ්චල දේපළ මෙකී රේන්ද කාලය තුළ දී විකිණීමට හෝ පැවරීමට තහනම් වන්නේ ය. මෙය කඩ කරන අයගේ ගිවිසුම අවලංගු වූවා සේ සැලකේ.

04. සෑම ටෙන්ඩර් පතක්ම සීල් තබන ලද කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ ''2014 වර්ෂය සඳහා අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය'' යනුවෙන් සඳහන් කර 2013 අගෝස්තු මස 02 වැනි දින පෙරවරු 10.30 ට පෙර අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතු ය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන්නේ නම් ඒවා ලියාපදිංචි තැපෑලෙන් ඉහත සඳහන් පරිදි එවිය යුතු ය.

05. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදල ගෙවිය යුතු ය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල තැන්පත් කිරීම පැහැර හැරියහොත් හෝ ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වූ බව ප්‍රකාශ කරනවාත් හැර එය පැහැර හරින්නාගේ නම සියලු සුරාබදු බලපත්‍රවලට අදාළ පැහැර හරින්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරගනු ලැබේ. ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් තැබීමෙන් හා නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු සියලුම ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

07. ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ :-

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටවිය යුතු ප්‍රදේශය හා කොටස* | *තැබෑරුම විවෘත කරන වේලාව* |
|---|---|---|---|
| 01 | අනුරාධපුරය | අනුරාධපුර නව නගරයේ නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප. ව. 2.00 දක්වා<br>ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා |

09. තනි බලයලත් පුද්ගලයා විසින් එහි අට (08) වැනි ඡේදයේ සඳහන් ප්‍රාදේශීය ලේකම් විසින් වෙන් කර දී ඇති ප්‍රාදේශීය පෙදෙසේ ගොඩනැගිල්ලක් සකස් කළ යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් යෝජිත ස්ථානයක් සපයා ගත යුතු ය. ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගෙන මිස තැබෑරුම වෙනත් ස්ථානයක විවෘත නොකළ යුතු අතර, එසේ කිරීමට ගත යුතු අනුමැතිය බලය ලැබීමේ වරප්‍රසාද ආරම්භවීමට දින 14 කට පෙර ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත යුතු ය.

10. රා තැබෑරුම පවත්වාගෙන යන ගොඩනැගිල්ල කිසියම් රජයේ ආයතනයකට සංස්ථාවකට හෝ පළාත් පාලන ආයතනයකට අයත් වන විට රේන්දයට අදාළ සම්පූර්ණ කාලයට එම ගොඩනැගිල්ල වෙනුවෙන් අදාළ ආයතනයට බද්ද ගෙවා ඒ බැව් ගිවිසුමේ අත්සන් කිරීමට පෙර සනාථ කළ යුතු ය.

11. මේ සම්බන්ධයෙන් විස්තර නැගෙනහිර නුවරගම් පළත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත යුතු ය.

12. *වැදගත්*.- 2013.08.02 වැනි දින රා රේන්ද විකිණීමට නොහැකි වුවහොත් 2013.09.30 වැනි දින පෙරවරු 10.30 ට නැවත විකුණනු ලැබේ.

එස්. එම්. සමන් බන්දුලසේන,
ප්‍රාදේශීය ලේකම්,
නැගෙනහිර නුවරගම් පළාත,
අනුරාධපුරය.

07-171

# රජයේ නොවන දැන්වීම්

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) ඡේදය අනුව පහත නම සඳහන් සමාගමේ නම 2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වන ඡේදයේ නියමයන් පරිදි වෙනස් කළ බව මෙයින් දන්වා සිටිමු.

සමාගමේ කලින් නම : කොපෙල්ස්ටෝන් (පීවීටී)
සමාගමේ අංකය : පී වී 79737
ලියාපදිංචි ලිපිනය : අංක 2, ඩීල් ප්ලේස්, කොළඹ 3
සමාගමේ අළුත් නම : ෆර්ස්ට් කැපිටල් ඉන්වෙස්ට්මන්ට්ස් (පීවීටී) එල්ටීඩී.

කේ. එච්. එල්. කෝපරේට් සර්විසස් ලිමිටඩ්,
ලේකම්වරු.

07-32

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : රිඈක්ට්ව් පේපර්ස් (පී. වී. ටී.) එල්. ටී. ඩී.
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 65071
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 60, මාදින්නාගොඩ පාර, රාජගිරිය.
සමාගම ලියාපදිංචි කළ දිනය : 2008.08.06.

07-29/3

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : කැන්ලි කෙමිකල්ස් (පී. වී. ටී.) එල්. ටී. ඩී.
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 72511
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : 101, "ශ්‍රියානි" වැත්තෑව, රත්දොළුගම
සමාගම ලියාපදිංචි කළ දිනය : 2010.06.02.

07-29/1

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : සෙබෙක් ලංකා (පී. වී. ටී.) එල්. ටී. ඩී.
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 76021
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 3, වික්ටරි උද්‍යානය, හෝකන්දර දකුණ, හෝකන්දර.
සමාගම ලියාපදිංචි කළ දිනය : 2010.12.14

07-29/2

## අංක 15375 දරන ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම සම්බන්ධවයි

ඉහත නම් සඳහන් අසුරමුනිදූගේ ග්වෙන්ඩලින් මේරි ගුණවර්ධන වන මා විසින් වර්ෂ 2011.06.13 වැනි දින වසන්තා අමරසේකර ප්‍රසිද්ධ නොතාරිස් මහත්මිය විසින් ලියාසහතික කළ අංක 15375 දරන ඇටර්නි බලපත්‍රය පිට, කුරුණෑගල, තෙලියා ගොන්න, වෙන්නරුව වැව පාර, අංක 36 දරන ස්ථානයේ පදිංචි රාජගුරු මුදියන්සේලාගේ අරවින්ද ලහිරු බණ්ඩාර යන අය ඇටර්නි බලකරු වශයෙන් පත් කරන ලද බවත්, ඒ අනුව එකී අංක 15375 දරන ඇටර්නි බලපත්‍රය ඉහත නම් සඳහන් ප්‍රකාශ කාර මා විසින් අවලංගු කර බලරහිත කර දමමි.

07-28

## ඇටර්නි බලපත්‍ර අවලංගු කිරීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොඩම්වල, ශ්‍රීමත් කුඩා රත්වත්ත මාවත, අංක 354/1, දරන ස්ථානයේ පදිංචි චන්ද්‍රා ලක්ෂ්මී රුබේරු වන මා විසින් ඩබ්. එම්. කේ. අයි. බී. විජේකෝන් ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද අංක 8637 දරන 2010.06.07 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් දොඩම්වල ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවත අංක 354/1 හි පදිංචි බණ්ඩාරනායක මුදියන්සේලාගේ සුනිල් බණ්ඩාරනායකට පවරා දුන් ඇටර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ට කරන බව මෙයින් දැනුම් දෙමි. තවද, මෙම දිනයෙන් පසුව මේ සම්බන්ධව යම් ක්‍රියාවක් කර ඇත්නම් එයට මා වග නොකියන බව දන්වමි.

චන්ද්‍රා ලක්ෂ්මී රුබේරු.

07-51

## ප්‍රසිද්ධ දැන්වීමයි

කොළඹ 10, ආර්නෝල්ඩ් රත්නායක මාවතේ, අංක 75 දරන ස්ථානයේ පිහිටි ලියාපදිංචි අංක පී බී 1660 හිමි කෙල්සි හෝල්ඩිංස් ලිමිටඩ් ලියාපදිංචි අංක පී. කියු 69 හිමි කොළඹ 3 සීල් ප්ලේස් අංක 2 ස්ථානයේ පිහිටි ඩුනාමිස් කැපිටල් පීඑල්සී සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 242 (1) ඡේදය යටතේ 2013 මාර්තු 27 වැනි දින ඒකාබද්ධ කිරීමේ කටයුතු නිමාවට පත් කළ බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 244 (3) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ කරන ලද සමාගමේ නම : ඩුනාමිස් කැපිටල් පීඑල්සී.

කේ. එච්. එල්. කෝපරේට් සර්විසස් ලිමිටඩ්,
ලේකම්වරු.

07-31

**වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ නව වැනි ඡේදය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ස්කෝප් ලංකා කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92053
දිනය : 2013 අප්‍රේල් මස 11 වැනි දින
සමාගමේ ලිපිනය : අදියර 03, අංක 285, ආර්. ඒ. ඩී. මෙල් මාවත, කොළඹ 03.

ලේකම්වරුන්.

07-45

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ද සැන්වුවරි බුටික් බන්ගලෝ කැන්ඩි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92762
ලියාපදිංචි ලිපිනය : අංක 45, බේබෘක් වීදිය, කොළඹ 02
සංස්ථාපිත දිනය : 2013 මැයි මස 29 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-06

---

**ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සමාගමක් සංස්ථාපනය කිරීම පිණිස කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : එන් කේ සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 92827
ලියාපදිංචි ලිපිනය : අංක 90, 2 වැනි මහල, රජයේ ලිපිකරු සේවා සංගම් ගොඩනැගිල්ල, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත, කොළඹ 02
සංස්ථාගත කළ දිනය : 2013 ජුනි 03 වැනි දින.

ඉදිරිපත් කිරීම.-

එන්. කේ. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

07-05

---

**වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි ජේදය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ශ්‍රී රාම් ඔටෝමොබයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92611
දිනය : 2013 මැයි මස 20 වැනි දින
සමාගමේ ලිපිනය : අංක 18, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.

අරවින්දියපිල්ලෙයි කතිරේසන්,
අධ්‍යක්ෂ.

07-07

---

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 91(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නම : විවේකා හොස්පිටල් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි දිනය : 2009.03.23
සමාගමේ අංකය : පී වී 12458
ලියාපදිංචි කාර්යාලය : අංක 10 ඒ, කලගෙඩිහේන පාර, වේයන්ගොඩ.

ආර්. කේ. ජයවීර මිය,
සමාගම් ලේකම්.

07-08

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව, පිරමිඩ් විල්මා ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, 2013 මැයි 29 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : පිරමිඩ් විල්මා ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 92772
ලියාපදිංචි ලිපිනය : අංක 4, 2/1, ලෝරිස් පාර, ආර්. ඒ. ඩී. මෙල් මාවත, කොළඹ 04.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

07-12

## ඇටර්නි බලපත්‍රයක් අවලංගු කිරීම

ඇමරිකා එක්සත් ජනපදයේ, නිව්යෝර්ක් 10301, ස්ටැටන් අයිලන්ඩ්, බෙ ස්ට්‍රීට් හි අංක 200 දරන ස්ථානයේ පදිංචි රත්නායක මුදියන්සේලාගේ ආයුවර්ධන කුමාරසිරි වන මම නිව්යෝක් නුවර ප්‍රසිද්ධ නොතාරිස් මොයිස් ටොහුන්ගුවා මහතා විසින් 2010.02.24 වැනි දින ලියා සහතික කරන ලද ඇටර්නි බලපත්‍රය මගින් ශ්‍රී ලංකාවේ, වැලිපැන්නගහ හරහා එගොඩමුල්ල, තුෂාර මාවත පදිංචි රත්දෙනි මුදලිගේ ශම්මික මිහිරාල් රත්දෙහි යන අය මාගේ නිත්‍යානුකූල ඇටර්නි බලකරු ලෙසට පත්කිරීම මෙයින් අවලංගු කොට අහෝසි කරන බවත්, ඒ අනුව එකී ඇටර්නි බලපත්‍රය මෙතැන් පටන් බලරහිත ලේඛනයක් බවත් සියලු දෙනාම වෙත මෙයින් දන්වා සිටිමි.

රත්නායක මුදියන්සේලාගේ ආයුවර්ධන කුමාරසිරි.

07-25

---

## සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ඒ ඊ එල් පෝට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය හා දිනය : පී වී 92765
සංස්ථාගත කිරීමේ දිනය : 2013 මැයි 29
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ඇක්සස් ටවර්ස් ලෙවල් 8, අංක 278, යුනියන් පෙදෙස, කොළඹ 02.

පී. ඩබ්. කෝපරේට් සෙක්‍රටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

07-49

---

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 දරන වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැනුම්දීමයි.

සමාගමේ නම : ඒපෙක්ස් ස්ටීල් ස්ට්‍රක්චර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සංස්ථාපනය කළ දිනය : 2010.08.09
ලියාපදිංචි අංකය : පී වී 73655
ලිපිනය : අංක 144/4, අවිස්සාවේල්ල පාර, කඩුවෙල.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් -

සමාගම් ලේකම්.

07-65

## දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 313, කොළඹ පාර, දම්බොක්ක, බෝයගනේ පදිංචි ඇන්තනි ස්ටැන්ලි ප්‍රූඩ් වන මම වර්ෂ 2013.02.06 වැනි දින එම්. එස්. එම්. තම්සීල් ප්‍රසිද්ධ නොතාරිස් ලියා සහතික කළ අංක 8232 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් අංක 197, මහ විදිය, කෑගල්ල යන ලිපිනයේ පදිංචි ෂාහුල් හමීඩ් මොහොමඩ් අමීන් යන අයට බලය පැවරූ අතර වර්ෂ 2013.06.17 වැනි දින සිට එකී බලය ප්‍රත්‍යාදිෂ්ට කර අවලංගු කරනු ලබන බව මෙයින් දන්වා සිටිමි.

ඇටෝර්නි අධිපති.

07-66

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (2) වගන්තිය ප්‍රකාරව

සමාගමේ පෙර නාමය : ලෙමන් ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 74796
ලියාපදිංචි ලිපිනය : අංක 41 2/1, ගෝල් ෆේස් ටෙරස්, කොළඹ 03
සමාගමේ නව නාමය : ද ඕෂන් කළම්බු (පීවීටී) එල්ටීඩී

07-81

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) ඡේදය

සමාගමේ නම : සිරිකාන්ති මැනුෆැක්චරර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 91553
ලියාපදිංචි කාර්යාලය : අංක 2 ඒ, ඉන්ඩස්ට්‍රියල් එස්ටේට්, ඉන්ඩස්ට්‍රියල් ඩිවෙලොප්මන්ට් බෝර්ඩ්, පනලුව, වටරැක.

සමාගමේ නම : කෙයාර් සිස්ටම්ස් සවුත් ඒෂියා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 91500
ලියාපදිංචි කාර්යාලය : අංක 410/95, බෞද්ධාලෝක මාවත, කොළඹ 07

සමාගමේ නම : රොවික්ටා ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 91430
ලියාපදිංචි කාර්යාලය : අංක 55, බාරොන් පෙරේරා මාවත, නව නගරය, ගොතටුව

සමාගමේ නම : සමනලගහවත්ත (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 92311
ලියාපදිංචි කාර්යාලය : අංක 16/ඒ, ශ්‍රී මහ විහාර පාර, දෙහිවල.

සමාගමේ නම : වයඹ ප්ලයිවුඩ් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 92265
ලියාපදිංචි කාර්යාලය : හඳුගල, පොතුහැර

සමාගමේ නම : යූ. එස්. කොස්මො ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 92189
ලියාපදිංචි කාර්යාලය : අංක 83 1/4, ගාළු පාර, කොළඹ 6.

සමාගමේ නම : ද පාම්ස් විලා ඉන්වෙස්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92127
ලියාපදිංචි කාර්යාලය : අංක 114, 6 ඩිග්‍රීස් නොර්ත්, ගාලු පාර, අම්බලන්ගොඩ.

සමාගමේ නම : ස්ටාර් ප්‍රොපර්ටීස් ඉන්වෙස්මන්ට්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 91987
ලියාපදිංචි කාර්යාලය : අංක 114, 6 ඩිග්‍රීස් නෝර්ත්, ගාලු පාර, අම්බලන්ගොඩ

සමාගමේ නම : ස්ටූර්ලැස්ගේඩ් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 91969
ලියාපදිංචි කාර්යාලය : අංක 16/ඒ, ශ්‍රී මහ විහාර පාර, දෙහිවල.

සමාගමේ නම : වෝල්ග්‍රිප් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 91905
ලියාපදිංචි කාර්යාලය : අංක 9/1, කේ. ඒ. වින්සන්ට් පෙරේරා මාවත, කොළඹ 14

සමාගමේ නම : ආර් එච් එම් ඉම්පෝට්ස් ඇන්ඩ් එක්ස්පෝට්ස් (පීවීටී)එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 91906
ලියාපදිංචි කාර්යාලය : අංක 99-18, ඇන්ඩර්සන් වීදිය, කුඩාපාඩුව, මීගමුව

සමාගමේ නම : ඉන්ඩිලෙක්ස් ගාර්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92471
ලියාපදිංචි කාර්යාලය : "නවෝදා", කරවිතගර, හලාවත.

07-80

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : පියෝ ටෙක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 60523
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : "සුසිරි" කටුවන පාර, හෝමාගම
ලියාපදිංචි දිනය : 2013.07.04.

ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු.

07-79

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මොරටුව, මොරටුවෙල්ල, ශාන්ත පීටර්ස් පාරේ, අංක 99 හි දැනට එක්සත් ජනරජයේ, එස්සොක්ස් ආර්. එම්. 16, 6 ඒ පී. ග්‍රේස්, වප්පොර්ඩ් හන්ඩ්‍රඩ්, ලෙනොක්ස් ක්ලෝස් පිහිටි අංක 53 හි පදිංචි (1) පොන්නහෙන්නදිගේ බ්‍රයන් නිරෝශන් ඩයස් (ජා. හැ. ප. අංක 86035294 වී) සහ (2) කුරුකුලසූරිය පල්පට්ටම්කුට්ටිගේ රීටා අයිරාංගනී ප්‍රනාන්දු (ජා. හැ. ප. අංක 565112260 වී) වන අපි මොරටුව ප්‍රසිද්ධ නොතාරිස් වන එච්. ශාන් බන්දුප්‍රිය පීරිස් මහතා විසින් 2008ක් වූ මැයි මස 11 වැනි දින සහතික කරන ලද අංක 6800 වන ඇටෝර්නි බලපත්‍රය මගින් මොරටුව, මොරටුවෙල්ල, ශාන්ත පීටර්ස් පාරේ, අංක 66 හි පදිංචි දිසානායකලාගේ චම්පා කල්මිනි පෙරේරා නොහොත් චම්පා නිල්මිනි පෙරේරා (ජා. හැ. ප. අංක 686483070 වී) නැමැත්තිය අපගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් පත්කර එකී ඇටෝර්නි බලපත්‍රය වන අංක 6800 මෙයින් අවලංගු කර ඉල්ලා අස්කරගත් බව ජනතාවට දැනුම් දෙන අතර, එකී බලකාරිය විසින් කරන සියලුම සම්බන්ධව ගනුදෙනු වලට අප වගකියන්නේ නැති බව ද මෙයින් දැනුම් දෙමු.

1. පොන්නහෙන්නදිගේ බ්‍රයන් නිරෝශන් ඩයස්
2. කුරුකුලසූරිය පල්පට්ටම්කුට්ටිගේ රීටා අයිරාංගනී ප්‍රනාන්දු

2013 මැයි මස 20 වැනි දින.

07-77

---

## සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 (1) වැනි වගන්තිය යටතේ මහජනයා වෙත කරන දැන්වීමයි.

සමාගම් නාමය : කෙටිකතා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 93015
ලියාපදිංචි කළ දිනය : 2013.06.12
කාර්යාල ලිපිනය : අංක 14, 59 වැනි පටුමග, ඕෆ් මැනිං ප්ලේස්, කොළඹ 06.

එල්. එම් මැනේජ්මන්ට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 291/32 ඒ,
හැව්ලොක් උද්‍යානය,
හැව්ලොක් පාර,
කොළඹ 05.

07-76

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කළගෙඩිහේන තිහාරිය අංක 438 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 498201644 වී හිමි මොහොමඩ් සහීඩ් කදීජා උම්මා වන මා විසින් තිහාරිය හිජ්රා මාවතේ අංක 438 හි පදිංචි ජා. හැ. අංක 593085090 වි හිමි සහීදු හාජියාර් මුහම්මදු ඉස්මත් යන අය වෙත ප්‍රදානය කරන ලද ගම්පහ මහාධිකරණ කලාපය තුළ නිට්ටඹුව පදිංචි එන්. ඩබ්. එරික් නිලන්ත ප්‍රසිද්ධ නොතාරිස් තැන සහතික කළ අංක 108 සහ 2011.10.06 දිනැති ඇටෝර්නි බලපත්‍රය මෙම දැන්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි අහෝසිකර අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ පොදු ජනතාවට මෙයින් දන්වා සිටිමි.

මොහොමඩ් සහීඩ් කදීජා උම්මා.

07-72

**සමාගමක නම වෙනස් කිරීම සම්බන්ධයෙන් මහජනතාව වෙත කෙරෙන නිවේදනය**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගමේ නම 2013 මාර්තු මස 23 වැනි දින සිට වෙනස් වූ බවට මෙයින් දන්වමු.

පෙර තිබූ නම : කප්තුර ෆිනෑන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 992
ලියාපදිංචි කාර්යාලය : අංක 13, රෝහල පාර, රඹුක්කන.

රීසන්ට් ට්‍රේඩ් අම්පයර්ස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

07-71

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ජී එච් චන්දන ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92803
සංස්ථාගත කළ දිනය : 2013.05.31
ලියාපදිංචි කාර්යාලය : අංක 197, ගාලු පාර, රත්මලාන.

අධ්‍යක්ෂක.

07-149

---

**දැන්වීමයි**

ස්කයි ටෙලිවිෂන් ඇන්ඩ් රේඩියෝ නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ඒකාබද්ධ කිරීම

ස්කයි ටෙලිවිෂන් ඇන්ඩ් රේඩියෝ නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ඒකාබද්ධ කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාරව සම්පූර්ණ කරන ලද බවත් 2007 අංක 07 දරන සමාගම් පනතේ 244(1) (අ) වගන්තිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඒකාබද්ධ කිරීමේ සහතිකයක් 2013 ජූලි 01 වැනි දින නිකුත් කර තිබෙන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ කළ සමාගමේ නම : ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ඒකාබද්ධ කළ සමාගමේ ලියාපදිංචි කරන ලද ලිපිනය : අංක 475, යුනියන් පෙදෙස, කොළඹ 02
ඒකාබද්ධ කළ දිනය : 2013 ජූලි මස 01 වැනි දින
ඒකාබද්ධ කළ සමාගමේ ලියාපදිංචි කළ අංකය : පී වී 261

ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සභාපති.

2013 ජූලි මස 05 වැනි දින.

07-152

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ඇමෙරිකාව, මෙරිලේන්ඩ් 20832, ඔල්නේ ජෙලන් ඩ්‍රයිව් සින්ගර්ස් අංක 3529 හි (No. 3529 Singers Glen Drive, Olney, Maryland 20832, United States of America) පදිංචි සුසිත හේමකුමාර ද සිල්වා ජයරත්න වන මා කොලොම්බියා හි ඩොමිටා කේ. වොලස් (Domita K Wallace) ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2005.06.13 වැනි දින ලියා සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය මගින්, හෝමාගම, ගලවිලවත්ත, සමන් මාවතේ, අංක 9/4 හි පදිංචි උරල ශිලා හේමජිනා ද සිල්වා වෛද්‍යනාත යන අය වෙත පවරා දෙන ලද සියලුම ඇටෝර්නි බලතල අවලංගු කරන බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි.

මෙම ඇටෝර්නි බලපත්‍රය 2005.07.27 වැනි දින, දින පොත් අංක 10337 හා 305/133 දරන පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත.

සුසිත හේමකුමාර ද සිල්වා ජයරත්න,

2013ක් වූ මැයි මස 27 වැනි දින දී ය.

07-170

---

**නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ කලින් නම : ලෙකෝ මීටරින් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 63270
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 411, ගාලු පාර, ඉ. එච්. කුරේ බිල්ඩින්, කොළඹ 03
සමාගමේ අලුත් නම : අන් ටෙ ලෙකෝ මීටරින් කම්පැනි (පීවීටී) එල්ටීඩී
නම වෙනස් කළ දිනය : 2008 ජූලි මස 21 වැනි දා

අන්ටෙ ලෙකෝ මීටරින් කම්පැනි (පීවීටී) එල්ටීඩී සමාගම සඳහා සහ වෙනුවෙන්,

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2013 ජූනි මස 20 වැනි දින.

07-165/1

---

**වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ලෙකෝ මීටරින් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 63270
ලියාපදිංචි කළ දිනය : 2008 මාර්තු මස 03 වැනි දා
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 411, ගාලු පාර, ඉ. එච්. කුරේ බිල්ඩින්, කොළඹ 03

ලෙකෝ මීටරින් (පීවීටී) එල්ටීඩී සඳහා සහ වෙනුවෙන්

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී
සමාගම් ලේකම්වරුන්.

07-165/2

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන ආඥා පනතේ අංක 9 දරන වගන්තිය යටතේ සමාගමක් නාමය වෙනස් ගත කිරීම සම්බන්ධයෙන් වන දැන්වීමයි.

සමාගම සංස්ථාගත කළ නාමය : ඔරෙල් මැනුෆැක්චරින් (පීවීටී) එල්ටීඩී
සමාගම් නාමය වෙනස් කිරීමෙන් පසු නව නාමය : ඔරෙල් කෝපරේෂන් (පීවීටී) එල්ටීඩී
සමාගම සංස්ථා ගත කළ අංකය : පී. වී. 72125
සමාගමේ නම වෙනස් කළ දිනය : 2013.03.01
ලියාපදිංචි ලිපිනය : අංක 49, ශ්‍රී ජිනරත්න පාර, කොළඹ 02.

එස්. පී. ඒ. කෝපරේට් සර්විසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-88

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන ආඥා පනතේ අංක 9 දරන වගන්තිය යටතේ සමාගමක් සංස්ථා ගත කිරීම සම්බන්ධයෙන් වන දැන්වීමයි.

සමාගම සංස්ථාගත කළ නාමය : එම්. ජේ. එෆ්. මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථා ගත කළ අංකය : පී. වී. 79545
සංස්ථාගත කළ ලිපිනය : අංක 111, මීගමුව පාර, පෑලියගොඩ
සංස්ථා ගත කළ දිනය : 2011.06.21

එස්. පී. ඒ. කෝපරේට් සර්විසර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-89

### ප්‍රසිද්ධ දැන්වීමයි

ඒකාබද්ධ කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතෙහි VIII වන කොටසින් ඒකාබද්ධ කිරීමේ යෝජනාවෙන් අංක 70 එස්. ඩී. එස්. ජයසිංහ මාවත, කොහුවල නුගේගොඩ යන ස්ථානයෙහි ලියාපදිංචි කාර්යාලය පිහිටි සමාගම් අංක පී වී 82790 දරන අයිසීසී ඩිවෙලප්මන්ට් හෝල්ඩින්ග්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමග 49/16 ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයෙහි ලියාපදිංචි කාර්යාලය පිහිටි සමාගම් අංක පීවී 8627 දරන අයිසීසී ඉන්වෙස්ට්මන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් 2007 අංක 07 දරන සමාගම් පනතෙහි VIII වන කොටසින් ඒකාබද්ධ කිරීමේ විෂය සම්බන්ධවයි.

ප්‍රසිද්ධ දැන්වීමක් මගින් දැනුම් දෙනු ලබන්නේ අයිසීසී ඩිවෙලප්මන්ට් හෝල්ඩින්ග්ස් ප්‍රයිවට් ලිමිටඩ් සමග අයිසීසී ඉන්වෙස්ට්මන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ් 2013 ජූලි 25 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒකාබද්ධ කිරීමේ යෝජනාවක් ඉදිරිපත් වීමෙනි.

සමාගම්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වනුයේ මෙම ඒකාබද්ධ වීමේ යෝජනාව සමාගම්හි හොඳම යහපතට බවත් එසේ ඒකාබද්ධ වූ සමාගම අයිසීසී ඩිවෙලප්මන්ට් හෝල්ඩින්ග්ස් ප්‍රයිවට් ලිමිටඩ් ඒකාබද්ධ වූ විගසින් ම කාර්‍යසාධකව බංකොලොත් භාවයේ පරීක්ෂණයෙන් සෑහීමක් ඇතිවන බවයි.

සමාගම්හි යම් කොටස්කරුවකුට හෝ තැන්පත්කරුවකුට හෝ පරීක්ෂා කිරීම සඳහා යෝජිත ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් 49/16 ගාලු පාර, කොළඹ 03 සමාගමෙහි සමාගම් ලේකම් භාරයේ සලසා ඇති අතර යම් කොටස් කරුවකුට හෝ තැන්පත්කරුවකුට හෝ වෙනත් යම් අයෙකුට හෝ සමාගම යටත් වීමක් වේ නම් සඳහන් කරන ලද යෝජිත ඒකාබද්ධ පිටපත් ලිඛිතව අයදීමකින් නොමිලයේ ලබා ගැනීමට වැඩ කරන දිනක පෙ. ව. 8.30 සිට ප. ව. 4.30 දක්වා වූ කාලය තුළ දී ලබා ගත හැක.

අධ්‍යක්ෂ මණ්ඩලය,

අයිසීසී ඩිවෙලප්මන්ට් හෝල්ඩින්ග්ස් ප්‍රයිවට් ලිමිටඩ්
සහ අයිසීසී ඉන්වෙස්ට්මන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්.

2013 ජූනි මස 19 වැනි දින.

07-104

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත සමාගම 2013 මැයි මස 27 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ටෙස්කෝ ඔෆිස් ඔටෝමේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 92709
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 40/1/ඒ, නව නුවර පාර, ගැමුණු පුර, කොතලාවල, කඩුවෙල.

සමාගම් ලේකම්.

07-98

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් සංස්ථාපනය කළ බවට වන දැන්වීමයි.

සමාගමේ නම : පැඩිසීන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 89570
ලියාපදිංචි ලිපිනය : අංක 16, නීතිඥ කාර්යාල සංකීර්ණය, කොටුව, මාතර.
ලියාපදිංචි කළ දිනය : 2012.11.26

අයි. එස්. එන්. කොත්තාගොඩ,
සමාගම් අධ්‍යක්ෂ.

07-99

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ලින්කෝ ඉංජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2013 ජූනි මස 03 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ලින්කෝ ඉංජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 92817
ලියාපදිංචි ලිපිනය : අංක 111/28 ඒ, රණවිරු ප්‍රියදර්ශණ මාවත, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071-8 244 495/077 8 197 041.

07-145

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ඔස්ටින් මැනර් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2013 මැයි මස 08 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඔස්ටින් මැනර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 92417
ලියාපදිංචි ලිපිනය : අංක 08, ඔස්ටින් පෙදෙස, කොළඹ 08.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8 244 495/077 8 197 041.

07-146

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ඔපියුලන්ට ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2009 නොවැම්බර් මස 30 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඔපියුලන්ට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 70183
ලියාපදිංචි ලිපිනය : අංක 154/2, කඩුවෙල පාර, මාළඹේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8 244 495/077 8 197 041.

07-147

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම පිළිබඳ දැන්වීමයි

පිළියන්දල, ගොරකපිටිය, ඇලපහල පාර, අංක 414/බී දරන ස්ථානයෙහි පදිංචි සමරරත්න ආරච්චිගේ සැම්සන් වන මා විසින් 2009.10.23 වැනි දින ඕමාන් හි දී අත්සන් තබන ලද ඇටෝර්නි බලපත්‍රය මගින් ඉහත මාගේ ලිපිනයෙහි ම පදිංචි සමරරත්න ආරච්චිගේ ප්‍රමුදිතා මනෝරි යන අයට මා වෙනුවෙන් සියලු බලතල පවරන ලදී. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ බස්නාහිර කලාප කාර්යාලයේ ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 42 කාණ්ඩයේ 66 පත්‍රිරුවේ 6837 දිනපොතේ අංකය යටතේ ලියාපදිංචි කරන ලද එකී ඇටෝර්නි බලපත්‍රය එකී ඇටෝර්නි අධිපති වන මා විසින් 2013.06.20 වැනි දින සිට අවලංගු කරන ලද හෙයින් එකී ඇටෝර්නි බලපත්‍රය අවංලගු කරන ලද බලරහිත ශූන්‍ය ලේඛනයක් බව සියලුදෙනා විසින් දැනගත යුතුයි.

සමරරත්න ආරච්චිගේ සැම්සන්.

07-126

---

### දැන්වීමයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ද කැටලිස්ට් ක්‍රියේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 91858
ලියාපදිංචි කාර්යාලය : අංක 18, බෝවිල පාර, පහල බෝමිරිය, කඩුවෙල.

07-125

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඩබ් එම් ටු කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 93050
දිනය : 2013.06.14
ලියාපදිංචි ලිපිනය : අංක 172, අලුත්කඩේ වීදිය, කොළඹ 12
සමාගමේ ලේකම් : සී මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම.

එස්. ඊ. සී (2) 2013/311

07-130

---

### නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

නම : එල් ඕ එල් සී ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 92639
ලියාපදිංචි ලිපිනය : අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

සී. එස්. එමානුවෙල් මිය,
සමාගම් ලේකම්.

2013 මැයි මස 31 වැනි දින.

07-142

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආයතනය සංස්ථාපිත කළ බවට දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : එල්. ටී. ප්‍රොඩක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 92608
ලියාපදිංචි ලිපිනය : අංක 7, 28 වැනි පටුමග, ෆ්ලවර් රෝඩ්, කොළඹ 3
ලියාපදිංචි දිනය : 2013.05.13

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ආයතනයීය ලේකම්වරු.

07-140

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි

ණය අංක : කේ/4/4881/කේවයි 3 /612, කේ 4/7442/කේවයි 4/352.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.05.21 *ගැසට් පත්‍රයේ* සහ 2011.02.25 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 09 හි බලයලත් වෙන්දේසිකාර එස්. මනම්පේරි විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.07.31 දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ පහත හේවාහැට ගන්දහය කෝරළේ ගඟවට කෝරළේ සහ මහනුවර කඩවත් සතර ප්‍රාදේශීය සභා සීමාව තුළ ගුරුදෙණිය පිහිටි පිච්චමල්වත්ත නොහොත් කිරිමැටියවත්ත ඉඩමට 1999.12.19 වැනි දින බලයලත් මිනින්දෝරු බී. පී. රූපසිංහ විසින් මැන සකසන ලද අංක 2307 දරන පිඹුරේ කැබලි අංක 3 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0 රූ. 0 පර්. 26.60ක් වූ බිම් කොටස සමග සියලුම දෑ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම් පත් අංක ජී 341/252 යටතේ ලියා පදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ගය ලෙස අංක 2307 දරන පිඹුරේ කැබලි අංක 08ක් වූ බිම් කොටස.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිනී.*

2013 ජූනි මස 08 වැනි දින.
කොළඹ 03,
ගාලු පාරේ අංක 269,

07-87/1

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි

ණය අංක : 6/40538/එල් 6/630.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.04.15 *ගැසට් පත්‍රයේ* සහ 2005.06.04 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර ඩයස් ගොඩනැගිල්ල, අංක 39 හි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.08.15 දින පස්වරු 3.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ පානදුර ප්‍රාදේශීය සභා සීමාවේ කෙසෙල්වත්ත උප කාර්යාලයට අයත් පල්ලිමුල්ල පිහිටි මුදුගහවත්ත හෙවත් හේනෙවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එල්. ඩබ්. එල්. ද සිල්වා විසින් මැන සකසන ලද 1997.06.05 වැනි දින හා අංක 14047 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 12 ඒ ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූ. 0, පර්. 6ක් වූ බෙදාවෙන් කළ බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමග වේ.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්පත් අංක එෆ් 182/372 යටතේ ලියාපදිංචි වී ඇත.

තවද, මෙම ඉඩම බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා විසින් 1987.05.27 වැනි දින හා අංක 6068 දරන පිඹුරේ කැබලි අංක 13 සහ 14 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිනී.*

2013 ජූනි මස 18 වැනි දින.
කොළඹ 03,
ගාලු පාරේ අංක 269,

07-87/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි

ණය අංක : ජීපී/02/3678/එක්ස්2/491.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.06.11 *ගැසට් පත්‍රයේ* සහ 2010.11.29 දිනැති දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 09 හි බලයලත් වෙන්දේසිකාර එස්. මනම්පේරි විසින් එම දේපළ පිහිටි ස්ථානයේ

දී 2013.08.06 දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම කෝරළේ උඩුගහපත්තුවේ මීරිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පිරිස්යාල පිහිටි සපුගහවත්ත නමැති ඉඩමට 2006.07.08 වැනි දින බලයලත් මිනින්දෝරු එම්. එම්. සී. බණ්ඩාර විසින් මැන සකසන ලද අංක 3045 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූ. 01, පර්. 1.0ක් වූ බිම් කොටස සමග සියළුම දේත් වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම් පත් අංක එෆ් 308/135 යටතේ ලියා පදිංචි වී ඇත.

මෙම ඉඩමට ප්‍රවේශ මාර්ග අංක 3045 දරන පිඹුරෙහි පරිදි වේ.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිනී.*

2013 ජුනි මස 18වැනි දින.
කොළඹ 03,
ගාලු පාරේ අංක 269,

07-87/3

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි

ණය අංක : ජීපී/19/02978/වයි19/134.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.03.19 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2010.06.11 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය වාද්දුව, තල්පිටිය උතුර, මැද පාර, අංක 40 හි බලයලත් වෙන්දේසිකාර ඩී. පී. එල්. සී. ද සිල්වා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.08.08 දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ (දංකොටුව උප කාර්යාලය) ඔිතර දකුණ ප්‍රාදේශීය සභා සීමාව තුළ දික්වෙල පිහිටි කෝන්ගහවත්ත පහෙන් දෙපංගුව කැබැල්ල ඉඩමට 2004.03.27 වැනි දින බලයලත් මිනින්දෝරු ජී. ඒ. එච්. ගුණතිලක විසින් මැන සකසන ලද අංක 1085 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූ. 0, පර්. 27ක් වූ බිම් කොටස සමග සියලුම දේත් වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්පත් අංක ඊ 107/56 යටතේ ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිනී.*

2013 ජුනි මස 18 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ අංක 269,

07-87/4

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි

ණය අංක : 07/001/06/00799/එම්ජී1/569.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.09.24 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2011.02.25 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 09 හි බලයලත් වෙන්දේසිකාර එස්. මනම්පේරි විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.08.13 දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ අධිකාරි පත්තුවේ රයිගම් කෝරළේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 667 ඒ රේරුකාන ග්‍රාමසේවා කොට්ඨාසයේ බද්දේගොඩ ග්‍රාමයේ පිහිටි දික්හේනවත්ත නමැති ඉඩම සර්වේයර් ජනරාල්වරයා විසින් සකසන ලද අංක 3066 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 7 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූ. 0, පර්. 14.82 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස වේ.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් පත් අංක එල්. ඩී. ඕ. 44/189 යටතේ ලියාපදිංචි වී ඇත.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිනී.*

2013 ජුනි මස 18 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ අංක 269,

07-87/5

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එන්. තියාගරාජා සහ පී. සී. කේ. සරණපාල.

ගිණුම් අංක : 1007 5076 1180.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2007.04.26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හාර ලක්ෂ අනූ තුන් දහසක (රු. 4,93,000) මුදල ද, 2006 සැප්තැම්බර් මස 01 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර ලක්ෂ අසූ පන් දහසක (රු. 4,85,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2008.08.08 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2008.07.28 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.07.25 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර පාත හේවාහැට ගන්දහය කෝරළේ පාත හේවාහැට ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හපුතලේ පල්ලේගම ග්‍රාමයේ පිහිටි බොරුමුල්ලේපිහිටි හේන යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඒ. පියදාස යන අය විසින් සාදන ලද 2005 මාර්තු මස 08 දාතම හා අංක 348/03/2005 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පතන්වෙල වත්ත, නැගෙනහිරට : රටේමුල්ල සිට තලාතුඔය දක්වා පාර, දකුණට : බලයලත් මානක තැන ජී. ආර්. ඩබ්ලිව්. එම්. වීරකෝන් යන අය විසින් සාදන ලද අංක 11717 දරන පිඹුරේ ලොට් 1 සහ නිරිතට සහ බස්නාහිරට : බලයලත් මානක තැන ජී. ආර්. ඩබ්ලිව්. එම්. වීරකෝන් යන අය විසින් සාදන ලද අංක 5656 දරන පිඹුරේ ලොට් 7 හි ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම් කොටස සමග එහි පිහිටි සෑම සියලු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්‍ඉරුව ජී 420/103 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-157/1

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එච්. එම්. එස්. කේ. එස්. බණ්ඩාර.

ගිණුම් අංක : 0025 5001 6551 .

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2002.03.21 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව හාර ලක්ෂ අසූ දහසක (රු. 4,80,000) මුදල ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2003.05.09 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ, 2006.08.25 වැනි දින "දිවයින", සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.07.25 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ දකුණු මාතලේ අස්ගිරිපල්ලේසියපත්තුවේ දඹරව පිහිටි පල්ලේවලව්වේතැන්න යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. රංචාගොඩ යන අය විසින් සාදන ලද 1985 පෙබරවාරි මස 20 දාතම හා අංක 795 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 3 ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සඳහා වෙන් කළ අංක 795 දරන එකී පිඹුරේ ලොට් 2, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 3 බී, දකුණට : දෙවට සහ බස්නාහිරට : මාටින් උන්නැහේට අයිති ඉඩම දැන් ඩැන්ගන් එස්ටේට් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තිස් දෙකයි දශම පහයි හයක් (අ. 0, රූ. 2, පර්. 32.56) විශාල ඉඩම් කොටස සමග වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 795 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව බී 483/25 යටතේ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-157/2

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

යූ. ජී. සමන්ත සහ ඒ. ජී. ආර්. පී. කුලතුංග.
ගිණුම් අංක : 1025 5008 8719.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009ක් වූ මාර්තු මස 13 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 36865 ප්‍රකාර රුපියල් හයලක්ෂ හැටහතර දහස් දෙසිය හයයි ශත විසි දෙකක (රු. 6,64,206.22) මුදලක් 2009 ජනවාරි මස 07 වැනි දින සිට අංක 36865 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන්ලක්ෂ හැත්තෑ හත් දහස් නමසිය අසූහතරයි ශත විසි එකක (රු. 5,77,984.21) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.09.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2009.08.28 වැනි දින "දිවයින" "අයිලන්ඩ්" සහ " තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.07.25 වැනි දින පෙ. ව. 10.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### *උපලේඛනය*

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දකුණු මාතලේ, කොහොන්සිය පත්තුවේ තැන්නේ පිහිටි දුනුමදලගහමුල්ල හේන යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන යූ. එච්. බී. කේ. එම්. ටී. අංගම්මන යන අය විසින් සාදන ලද 2003 අගෝස්තු මස 20 වැනි දින බෙදා වෙන් කරන ලද සහ 2003 ජූලි 30 දාතම හා අංක 1175 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 09 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට සහ නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 13 වශයෙන් ලකුණු කොට ඇති අඩි 15 පලළ මාර්ග පිවිසුම, දකුණට : ලොට් 8 සහ බස්නාහිරට : එකී පිඹුරේ ලොට් 14 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහක් (අ. 0 රූ. 0 පර්. 12) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද, වගාවන් ද එකී පිඹුරේ ලකුණු කොට ඇති මාර්ග භාවිත කිරීමේ අයිතිය ද වෙළුම/පත්ඉරුව බී 562/131 හි මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-157/3

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

(සිය සිවිල් අධිකරණ බලය විෂයයෙහි) කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුව අනුව මා වෙත පවරා ඇති අධිකාරිය ප්‍රකාර

ලංකා ඔරික්ස් ලීසිං කම්පැණි පීඑල්සී
(කලින් ලංකා ඔරික්ස් ලීසිං කම්පැණි ලිමිටඩ් යනුවෙන් නම් කර හඳුන්වනු ලැබූ)
අංක 100/1 1/1,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.
(සමාගමේ නව අංකය පී ක්‍යු 70)

නඩු අංකය :
එච්. සී. (සිවිල්)
12/09/එම්. ආර්.

................................*පැමිණිලිකරු.*

*එදිරිව*

ජෙයිනුල් ආබ්දීන් මොහොමඩ් රහීම්,
අංක 19, ඇටම්පොලවත්ත පාර,
හැඳල, වත්තල.

...................................*විත්තිකරු.*

වර්ෂ 2010ක් වූ සැප්තැම්බර් මස 02 වැනි දින ඉහත අංකය දරන නඩුවේ ඇතුලත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව ඉහත සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට රුපියල් 5, 775,807 ක මුදලක් සහ රුපියල් 5,634,397 ක මුදලක් මත වර්ෂ 2008.07.08 වැනි දින සිට තීන්දු ප්‍රකාශිත දින දක්වා මසකට 4% බැගින් පොලිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නෛතික පොලිය අයකර දෙන ලෙස නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

පැමිණිල්ලේ උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම හා ස්ථානය ද ඊට අයත් මාර්ග ප්‍රවේශ සහ විත්තිකරුට අයත් සියලුම අයිතිවාසිකම්, හිමිකම් සම්බන්ධකම් හා කවර අන්දමේ ඉල්ලීම් ද සහිතව හා සියලුම කුලී ලාභ හෝ අනිකුත් ආදායම් හා එකී ඉඩම හා ස්ථානය නිසා ඇතිවන සියලුම ලැබීම් හා විත්තිකරුට හිමි සියලුම අයිතිවාසිකම් ද ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා යටත් හා ඇස්කිසි කළ හැකි බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද, තව ද, ඉහත නම සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට මෙම අධිකරණයේ නිලධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ගෙවිය යුතු බවට තවදුරටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

එකී නඩුවේ තීන්දු ප්‍රකාශය ඉටු කිරීමට ඉහත නම සඳහන් විත්තිකරු අපොහොසත් වී ඇති හෙයින් එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ නියෝගයේ බලය පිට එකී විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දැක්වෙන 1995.05.13 වැනි දින දරන අංක 159/1995 දරන සැලැස්මයේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද කැබලි අංක 1ඒ/2 දරන පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10)ක් විශාල වූ දේපළ වර්ෂ 2013ක් වූ ජූලි මස 26 වැනි දින පෙරවරු 11.00 ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අදිකාරි පත්තුවේ, හුණුපිටිය යන ගමේ පිහිටි "කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්.සමරවික්‍රම විසින් වර්ෂ 1995.05.13 වැනි දිනැති මැන සාදන ලද අංක 159/1995 දරන සැලැස්මේ ප්‍රකාරව බෙදා වෙන් කරන ලද කැබලි අංක 1 ඒ/2 දරන කොටසට මායිම්, උතුරට : දැනට මෙරායා පීරිස් ට අයිතිය ඇති ඉඩම ද, නැගෙනහිරට : කැබලි අංක 1 ඒ 3 දරන කොටස ද, දකුණට : දිප්පිටිගොඩ පාර ද, සහ බටහිරට : කැබලි අංක 1 ඒ/1, දරන කොටස ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10)ක් විශාල ඉඩම වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව සී 508/227 හි ලියාපදිංචි වී ඇත.

ඉහත විස්තර කරනු ලබන ඉඩම මෑතක දී කරනු ලබන මැනීමකට අනුව පහත අයුරු වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, හුණුපිටිය නමැති ගමේ පිහිටි "කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. සමරවික්‍රම විසින් වර්ෂ 2007.02.10 වැනි දින මැන සාදන ලද අංක 31/2007 දරන සැලැස්මේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද කැබලි අංක X දරන කොටසට මායිම්, උතුරට : කලින් මෙරායා පීරිස්ට අයිති ඉඩම ද, නැගෙනහිරට : පිඹුරු අංක 1159/1995 හි කැබලි අංක 1ඒ/3, දරන කොටස ද, දකුණට : දිප්පිටිගොඩ පාර ද, (ජයන්ති මහල් හන්දියේ සිට දිප්පිටිගොඩ) සහ බටහිරට : පිඹුරු අංක 159/1995 හි කැබලි අංක 1ඒ/1, දරන කොටස ද, යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහයක් විශාල ඉඩම වේ.

*දේපළට පිවිසීම.* - ජපාන මිත්‍රත්ව පාලමේ සිට මීගමු පාර ඔස්සේ කි. මී. 2ක් පමණ ගිය විට හමුවන පොදු වෙළඳපොල මංසන්ධියෙන් දකුණු පසට ඇති ඇවරිවත්ත පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් කි. මී. 1.3ක් පමණ ගිය විට හමුවන දකුණු පසට ඇති දළුපිටිය පාරට හැරී තවත් මීටර් 500ක් පමණ ගිය විට ජයන්ති මහල් මංසන්ධිය හමුවේ. එම මංසන්ධියෙන්ද දකුණු පසට ඇති දිප්පිටිගොඩ පාරට හැරී මීටර් 150ක් පමණ ගිය විට වරිපනම් අංක 572 දරන අදාළ දේපළ මාර්ගයේ වම්පස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුයි.

01. ගැණුම් මිලෙන් 25%ක් (ආපසු ගෙවනු නොලබන),
02. පළාත් පාලන බදු වශයෙන් ගැණුම් මිලෙන් 1%ක්,
03. වෙන්දේසිය සඳහා වැය වන සියලුම ප්‍රචාරක වියදම් සහ ප්‍රවාහන ගාස්තු,
04. තක්සේරුකරුගේ ගාස්තු රුපියල් 13,950ක්,
05. විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තු රුපියල් 3,000,
06. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 2,500,
07. විකුණුම් අගය රුපියල් 7,500 ඉක්මවන විට රුපියල් 150ක් සහ එකී රුපියල් 7,500ක් ඉක්මවන සෑම රුපියල් 1,000 කට රුපියල් 5 බැගින් ගාස්තු ද නිශ්චල දේපළ මිලදී ගත් ගැණුම්කරු විසින් වෙන්දේසිකරුට ගෙවිය යුතුයි.
08. ගැණුම් මිලෙන් ඉතිරි 75% ක මුදල වෙන්දේසියේ දින සිට දින 30ක් තුළ දී වාණිජ මහාධිකරණයේ නැන්පත් කළ යුතු වන අතර ඒ සඳහා පිළිගත හැකි ඇපකරුවන් දෙදෙනෙකු එම් අවස්ථාවේ දී ම ඉදිරිපත් කරමින් විකුණුම් කොන්දේසි අත්සන් තැබිය යුතු ය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා සහකාර කළමනාකරු (නීති) ලංකා ඔරික්ස් ලීසිං කම්පැණි පීඑල්සී, අංක 100/1 1/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.

දුරකථන අංක : 5880888, 5880880.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011-3068185, 011- 2572940.

07-144

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මාතර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ අංක 16, පල්ලිමුල්ල, මාතර පදිංචි මහේන්ද්‍ර දේවනාරායන යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර නගර සභා සීමාව සහ කඩවත් සතර තුළ කොටුවේගොඩ, පරණ තංගල්ල පාර වරිපනම් අංක 120 දරන පර්චස් එකයි දශම පහයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 1.50) විශාල වටිනා වාණිජ දේපළ. ඉහත සඳහන් දේපළ 2013 ජූලි මස 30 වැනි දින පස්වරු 1.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - මාතර නගර මධ්‍යයේ පිහිටි නිල්වලා ගඟ හරහා දැමූ පාලමේ සිට පරණ තංගල්ල පාරට පිවිස එම මාර්ගයේ තවත් මීටර් 250ක් පමණ ගිය විට වරිපනම් අංක 120 දරන අදාළ දේපළ මාර්ගයේ දකුණු පස පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.*- රජයේ ගැසට් පත්‍රයේ 2010.08.06 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2010.07.30 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2010.08.05 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුයි.

01. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456476, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011-3068185, 011- 2572940.

07-143

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. ගැසට් පත්‍රය නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති *උපලේඛනයේ* දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| ජූලි | 2013.07.05 | සිකුරාදා | 2013.06.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.12 | සිකුරාදා | 2013.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.19 | සිකුරාදා | 2013.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.26 | සිකුරාදා | 2013.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2013.08.02 | සිකුරාදා | 2013.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.08 | බ්‍රහස්පතින්දා | 2013.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.16 | සිකුරාදා | 2013.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.23 | සිකුරාදා | 2013.08.08 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.08.30 | සිකුරාදා | 2013.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2013.09.06 | සිකුරාදා | 2013.08.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.13 | සිකුරාදා | 2013.08.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.20 | සිකුරාදා | 2013.09.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.27 | සිකුරාදා | 2013.09.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ජී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.